රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.06. 17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම

රට තුළ ඉන්ධන සැපයුම සීමා සහිත වීම තුළ පොදු ප්‍රවාහන සේවා ක්‍රියාත්මක වීම දුර්වල මට්ටමක පැවතීම සහ තම පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යයක් උපයෝගී කොටගෙන ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම ද දුෂ්කර කටයුත්තක් වීම සැළකිල්ලට ගෙන, 2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022 මඟින් දැනටමත් රජයේ කාර්යාල විවෘත නොකරන ලෙසට උපදෙස් ලබා දී ඇති සතියේ සිකුරාදා දිනයට අමතරව යෙදෙන සතියේ ඉතිරි වැඩ කරන දිනවල ද 2022.06.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි සති දෙකක කාලයක් රජයේ නිලධරයන් කාර්යාල වෙත කැඳවීම සීමා කිරීමට තීරණය කර ඇත.

02. රජයේ කාර්යයන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්යය මණ්ඩලය සේවයට කැඳවා ගැනීමට තීරණය කිරීම සහ තම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නිලධරයෙකු එම නිලධරයා පදිංචි ස්ථානයට ආසන්න අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත කිරීමේ බලය අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් වෙත පැවරේ.

03. එසේ අවම සේවක සංඛ්‍යාවක් සේවයට කැඳවන අවස්ථාවේ දී වුව ද සේවා මුර ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය.

04. එලෙස සේවා මුරයක් හෝ විධිමත් ක්‍රමවේදයක් සැකසීමෙන් පසු යම් නිලධරයෙකු ඒ අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය නිලධරයාගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

05. සේවා මුර ක්‍රමයට හෝ සේවයට කැඳවීමට අනුගමනය කරන විධිමත් ක්‍රමවේදයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයෙකුම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාළ කාර්යයන්හි යෙදීමට සූදානම්ව සිටිය යුතු ය.

06. එක් ප්‍රදේශයක පිහිටි රජයේ කාර්යාල වෙත නිලධරයන් සේවයට කැඳවීම සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ සාකච්ඡා කර අවශ්‍ය බස් රථ ලබා ගැනීමට එම ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගත යුතු ය.

07. සේවයට පැමිණෙන නිලධරයන්ට ද සෑම අවස්ථාවක දී ම පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීමට උපදෙස් ලබාදෙන ලෙසත් කාර්යාල අසල ස්ථිර පදිංචි හෝ තාවකාලිකව නැවතී සිටින නිලධරයන්ට ආයතනය සතු සංචිත වාහන උපයෝගී කොටගෙන මනා පිරිවැය කළමනාකරණයකින් යුතුව ප්‍රවාහන පහසුකම් සලසාදීමටත් ක්‍රියා කරන ලෙසත් මෙයින් දැනුම් දෙමි.

08. අධිකරණ ක්ෂේත්‍රයට අයත් ආයතන වෙත නිලධරයන් සේවයට කැඳවීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ඇත.

09. මෙම චක්‍රලේඛයේ විධිවිධාන රාජ්‍ය ව්‍යවසායන් සඳහා අදාළ කර ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විමසා එකී උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

10. තවද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය